# හදවතින් ලිවීම

හේමමාලා හේරත්

“යමක් ලියනකොට ඒක හොඳ නිර්මාණයක් වෙන්න නම් හදවතින්ම ලියන්න ඕනි.....” මේ මගේ උපදේශකවරයාගෙන් (මා විසින් පත් කරගත්) මට ලැබුණු අවවාදයකි. එම වචන කිහිපය, මගේ දෙසවනෙහි දෝංකාර වනු මට දැනුණේ වරක්, දෙවරක් නොවේ. දිනකට දහදොළොස් වතාවකි.

“හදවතින්ම ලියන්න ඕනි... ඒත් ලියන්න කාලය හොයා ගන්නේ කොහොමද? ” යන ප්‍රශ්ණය මගේ සිතට නැගුණේ ඊළඟටය.

ගැහැනියකට එක්තැනක හිඳ ගැනීමට පවා කාලයක් සොයාගත හැක්කේ අමාරුවෙනි. මවක, බිරිඳක, ගෘහණියක, දියණියක, සොහොයුරියක, යෙහෙළියක වශයෙන් ඇය විසින් රඟපෑ යුතු චරිත බොහොමයක් ඇති නිසාය.

උදෑසනින් අවදිව දරුවනට, සැමියාට, සමහරවිට තමන් සමඟ වෙසෙනා වැඩිහිටියනට දහවල් කෑම වේල සාදා වැඩට දිව යාම, රැකියාවක් නොකරන අයකු නම්, නිවස අස්පස් කිරීම, පිරිසිදු කිරීම, රෙදි සේදීම, ඉවීම, කඩේ යාම, බිල් ගෙවීම වැනි රාජකාරී රැසක් ගෘහණිය විසින් කළයුතු වන්නේය.

මවක ලෙසින් කළ යුතු දරුවන්ගේ කටයුතු මහමෙර තරම් උසය.

“මට දැන් කාමරේ අස් කරන්න වෙලා නෑ. හෝම් වර්ක් තියෙනවා....”

“යාළුවෙක් එනවා පාඩම් කරන්න. එයාටත් ඩිනර් හදන්න....”

මෙවැනි අමතර රාජකාරී මදිවාට, ළමුන්ගේ ක්‍රීඩා පුහුණු කටයුතුවලට ඔවුන් ගෙනයාම, ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සොයා බැලීම, ගුරු දෙගුරු සාකච්ඡාවලට සහභාගී වීම, ඒ මදිවාට ඔවුන්ගේ සුරතල් සතුන් බැලීමද මේ වැඩගොඩට ඇතුළත් වන්නේය. ළමයා වැරැද්දක් කළහොත් බැණුම් අසන්නේද මවම ය.

සැමියාගේ රාජකාරිවලද කෙළවරක් නැත.

“වෙන මේස් කුට්ටමක් නැද්ද ? ”

“ලන්ච් රෙඩිද? ඉක්මන් නොකළොත් ට්‍රැෆික් එකට අහුවෙනවා.”

“මගේ ෂර්ට් එක අයන් කළාද? ඒකේ ගැලවිලා තිබුණු බොත්තම ඇල්ලුවද?”

“අද මම එනකොට රෑ වෙනවා. ඔයා පුතාව ගිහින් පික් කරන්න.”

මේ කටයුතු සියල්ල අවසාන වනවිට සිදුවන්නේ ලිවීමට නොව හති දැමීමටය.

දියණියක ලෙස මව්රටේ සිදුවන සියළුම දෙයට වගකිව යුත්තේද ඇයමය.

“අම්මට අසනීපයි කියලා කොච්චර කල් කියනවද ? නිකංවත් ඇවිත් දුක, සැප බලලා ගියොත් නරකද ?”

තම පාර්ශවයෙන් පමණක් නොව, ස්වාමිපුරුෂයාගේ පාර්ශවයෙන් දොස් අසන්නට සිදුවන්නේ ඇයටය.

යෙහෙළියක ලෙසින් සාද, උපන්දින උත්සව,




***“වෙන මේස් කුට්ටමක් නැද්ද ? ”***

***“ලන්ච් රෙඩිද? ඉක්මන් නොකළොත් ට්‍රැෆික් එකට අහුවෙනවා.”***

***“මගේ ෂර්ට් එක අයන් කළාද? ඒකේ ගැලවිලා තිබුණු බොත්තම ඇල්ලුවද?”***

***“අද මම එනකොට රෑ වෙනවා. ඔයා පුතාව ගිහින් පික් කරන්න.”***

***මේ කටයුතු සියල්ල අවසාන වනවිට සිදුවන්නේ ලිවීමට නොව හති දැමීමටය.***

31 වන පිටුවට




